සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# නාට්‍ය හා රංගකලාව - I

**12 ශ්‍රේණිය** — **කාලය පැය 01 යි.**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුර දී ඇති වරණ තුළින් තෝරා වරහන් තුළ ලියා දක්වන්න.

---

(01) ප්‍රාසාංගික කලා පමණක් අඩංගු වරණය වන්නේ,
(1) සංගීතය, මූර්ති, මුද්‍රා
(2) සංගීතය, සිනමාව, චිත්‍ර
(3) නර්තනය, සංගීතය, නාට්‍ය
(4) සිනමාව, ටෙලිනාට්‍ය, ගීත නාට්‍ය
(5) ගීත නාට්‍ය, මූර්ති, මුද්‍රා (........)

(02) සිනමාවට සම්බන්ධ නොවන ප්‍රකාශය,
(1) ශ්‍රව්‍යදෘශ්‍ය කලා මාධ්‍යයකි. (2) සජීවී ව ඉදිරිපත් කරයි.
(3) සංස්කරණය කළ හැකිය.
(4) රූප නිර්මාණය කිරීමේ දී කැමරා ඇසට සරිලන ලෙස සකසයි.
(5) දෙබස් කටපාඩම් කිරීම අනවශ්‍යයි. (........)

(03) කාලය, අවකාශ, සිදුවීම් සීමාවකින් තොරව භාවිතා කළ හැකි මාධ්‍යයකි.
(1) සිනමාව (2) කෙටි කථාව (3) වේදිකා නාට්‍ය
(4) නර්තනය (5) මුද්‍රා නාට්‍ය (........)

(04) 'අභිනය ' සංකල්පය මුලින් ම හඳුන්වා දෙන ලද්දේ,
(1) ග්‍රීක නාට්‍ය (2) සංස්කෘත නාට්‍ය (3) නෝ නාට්‍ය
(4) කබුකි (5) එලිසබතීන නාට්‍ය (........)

(05) නාට්‍ය ධර්මී සම්ප්‍රදායට අනුව නිෂ්පාදනය වූ නාට්‍යයකි,
(1) ලෝමහංස (2) කැලණි පාලම (3) නරි බෑණා
(4) හරිම බඩු හයක් (5) මූදු පුත්තු (........)

(06) භරතමුනිට අනුව නාට්‍යයක් හා සම්බන්ධ රස සංඛ්‍යාව
(1) හතරකි. (2) දෙකකි (3) අටෙකි (4) පහකි (5) නමයකි (........)

(07) රංගපීඨය මත ඇති පිටුපස සුදු තිරය,
(1) රැළි තිරයයි (2) දෙපැති තිරයයි (3) නිල් පාට තිරයයි
(4) චිත්‍රවස්ත්‍ර දවටනයයි (5) ගගනිකාවයි (........)

(08) නාට්‍යයක එක් තැනක සිට දුර බැහැර තැනකට යාම නිරූපණය සඳහා රංගභූමිය මත වටයක් ඇවිදීම
(1) ලෝක ධර්මීය. (2) කක්ෂ්‍යා විභජනයයි.
(3) නාට්‍ය ධර්මී ය. (4) අවකාශ භාවිතයයි.
(5) වේදිකාව කොටස්කර භාවිතයයි. (........)

(09) රංගභූමි පාලක සතු වගකීමක් නොවන්නේ,
(1) නළු නිළියන් මෙහෙයවීම (2) ප්‍රේක්ෂාව ඇති කිරීම.
(3) අනුශාංගික කලා සම්බන්ධීකරණය (4) සංවේශ පුහුණු පැවැත්මයි
(5) නාට්‍යයට මුදල් ලබාදීම (........)

(10) '' ලොව පැවැත්ම අනුකරණය නාට්‍යයයි ''....... ලෙස ප්‍රකාශ කරන ලද්දේ,
(1) ඇරිස්ටෝටල් (2) භරතමුනි (3) ධනංජය
(4) ස්ටැනිස්ලාවිස්කි (5) ඇලඩයිස්නිකොල් (........)

(11) දේශීය බෞද්ධ පූජාකර්ම අතරට,
(1) රාමා මැරීම අයත්ය. (2) මරා ඉපැද්දවීම අයත් ය. (3) කුටුම්බර නැටීම අයත්ය.
(4) ආලවක දමනය අයත් ය. (5) විජේරාජ නළුව අයත් ය. (........)

(12) '' නව රූපණ විධි ක්‍රම '' බිහිකරන ලද්දේ
(1) සැමුවෙල් බෙකට් (2) හෙන්රික් ඉබ්සන් (3) මෙයර්ගෝල්ඩ්
(4) ස්ටැනිස්ලාවිස්කි (5) බ්‍රෙටෝල්ට් බ්‍රෙෂ්ට් (........)

(13) සමාරෝපය යනු,
(1) අභිරූපණයයි. (2) අනුකරණයයි. (3) චරිතයට ප්‍රවිශ්ට වීමයි.
(4) භූමිකා නිරූපණය යි. (5) සංවාද භාවිතයයි. (........)

(14) සංස්කෘත නාට්‍යයක වස්තුව විකාශය වන්නේ,
(1) ප්‍රධාන කොටස් දෙකක් යටතේය..
(2) ප්‍රධාන කොටස් පහක් යටතේ ය.
(3) ප්‍රධාන කොටස් තුනක් යටතේ ය.
(4) ප්‍රධාන කොටස් හතරක් යටතේ ය.
(5) එක් කොටසක් ලෙස ය. (........)

(15) සාත්ත්වික භාවයට අයත් නොවනුයේ,
(1) ස්වරභංග (2) වෛවර්ණ්‍යය (3) වේපථු (4) අශ්‍රා (5) චාරි (........)

(16) සංස්කෘත නාට්‍යයෙහි ආංගික අභිනයේ ප්‍රභේද ලෙස දක්වා ඇත්තේ
(1) හස්ත (2) ප්‍රලය (3) ස්වේද (4) පූස්ත (5) අලංකාර (........)

(17) ' අලංකාර' ලෙස නාට්‍ය ශාස්ත්‍රයේ දක්වන්නේ,
(1) අංගරචනය යි. (2) සංගීතය යි. (3) ප්‍රේක්ෂාව යි.
(4) නාට්‍යෝපකරණ යි. (5) වේෂභූෂණ යි. (........)

(18) ''අභූතරූපී රංගනය '' ලෙස හඳුන්වන්නේ,
(1) සංවාද පද්‍ය ස්වරූපයෙන් භාවිතවන රංගනයන් ය.
(2) අධිතාත්විකවාදී විකට රූප මෙන් භූමිකා නිරූපණයයි.
(3) වාචිකාභිනයෙන් තොරව රූපණයයි.
(4) නාට්‍ය අතරතුර විටින් විට ප්‍රේක්ෂකයා සමග සංවාදයේ යෙදීමෙයි.
(5) චතුර්විධ අභිනය භාවිතයයි. (........)

(19) ඇරිස්ටෝටල් නම් දාර්ශනිකයා විසින් රචිත ග්‍රන්ථය,
(1) කාව්‍ය ශාස්ත්‍රයයි. (2) නාට්‍ය ශාස්ත්‍රයයි.
(3) නළුවෙකුගේ පෞරුෂයයි. (4) ඉක්නෙවුටා යි.
(5) නාට්‍ය දෘෂ්ටිය යි.

(20) '' ත්‍රිවිධ ඒකීයත්ව සංකල්පය හඳුන්වාදෙන ලද්දේ,
(1) භරතමුනි ය. (2) බ්‍රෙටෝල්ට් බ්‍රෙෂ්ට් ය.
(3) ඇරිස්ටෝටල් ය. (4) ඇරිස්ටෝෆානිස් ය.
(5) යුරිපිඩීස් ය. (........)

(21) ට්‍රැජඩියක 'අනපේක්ෂිත ගැටලු මතුවීම'

(1) ආහුලීකරණය යි. (2) අනාවරණය යි. (3) ප්‍රත්‍යාභිඥානය යි.

(4) ප්‍රත්‍යාවර්තනයයි. (5) භාව විශෝධනය යි. (........)

(22) ''කැතාසීස්කරණය ''සංකල්පය මුල්වරට හඳුන්වාදෙන ලද නාට්‍ය සම්ප්‍රදාය ලෙස,

(1) සංස්කෘත (2) නෝ (3) එලිසබතීන (4) රෝම (5) ග්‍රීක (........)

(23) නාට්‍යයක සිද්ධි ගැළපීමේ පිළිවෙල,

(1) රංග වින්‍යාස ය යි. (2) කථා වින්‍යාසය යි. (3) පෙළ ගැස්ම යි.

(4) තත්වානුරූපී ඡායවයි. (5) නාට්‍යයේ ගලා යෑමයි. (........)

(24) ''ප්‍රේක්ෂාව'' ඇති කිරීමේ වගකීම භාර වන්නේ,

(1) වේදිකා පාලකට ය. (2) අධ්‍යක්ෂකට ය. (3) රංග විනන්‍යකරුට ය.

(4) නළුවාට ය. (5) පසුතල නිර්මාණකරුට ය. (........)

(25) සංස්කෘත නාට්‍යයේ කතා වස්තු කොටස් පහ,

(1) අර්තෝපත්ෂේප වේ. (2) අර්ථප්‍රකෘති වේ. (3) සූච්‍ය වේ.

(4) අවස්ථා පංචකය වේ. (5) ඉතිවෘත්ත වේ. (........)

(26) සමස්ත නාට්‍ය පුරාම ක්‍රියාකාරී බලවේගය ලෙස හඳුන්වන්නේ,

(1) බීජය යි. (2) බින්දුවයි (3) ප්‍රාප්ත්‍යාශාවයි.

(4) පක්ෂතායි. (5) මේ සියල්ලම. (........)

(27) සංස්කෘත නාට්‍යයෙහි ''නේකෘත'' ලෙස හඳුන්වන්නේ,

(1) පොතේගුරාය (2) සූත්‍රධරය (3) කතා නායකයා ය.

(4) සහාය නළුවාය (5) විකට චරිතය යි. (........)

(28) 1824 නිර්මාණය වූ ''ඇහැලේපොළ'' නාඩගම රචනා කරන ලද්දේ,

(1) පේදුරු සිංඤෝ (2) පිලිප්පු සිංඤෝ (3) සී. දොන් බස්තියන්

(4) ජෝන් ද සිල්වා (5) චාල්ස් ඩයස් (........)

(29) වෙස්මුහුණ නාටක ප්‍රචලිත ප්‍රදේශයක් වන්නේ,

(1) ගෝනාපිනුවල (2) පමුණුගම (3) හඟුරන්කෙත

(4) යටිනුවර (5) දුවේ (........)

(30) ''කාරියකරවන රාළ'' විසින් පාත්‍රයින්ගේ පැමිණීම, කථාවස්තුව ඉදිරිපත්කරනු ලබන නාටක විශේෂය.

(1) සොකරි (2) කෝලම් (3) නාඩගම්

(4) නූර්ති (5) ශාන්තිකර්ම (........)

(31) ශ්‍රී ලංකාවේ කතෝලික ජන වන්දනා නාටක විශේෂය වන්නේ,

(1) පාස්කු (2) නාඩගම් (3) නූර්ති

(4) කෝලම් (5) කුත්තු (........)

(32) ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි පාලන සමයේ බිහි වූ නාටක විශේෂයකි.

(1) පාස්කු (2) නාඩගම් (3) නූර්ති

(4) නව නාටක (5) යාල්පනම් පාස්කු (........)

(33) ඇන්ටිගනී නාට්‍යයේ නිර්මාණකරු

(1) යුරිපිඩීස් (2) සොෆොක්ලීස් (3) ඊස්කිලස්

(4) හෙන්රික් ඉබ්සන් (5) ඇරිස්ටෝෆානිස් (........)

(34) මකුලොලුවගේ නාට්‍ය නිර්මාණ අතරට,

(1) කැලෑමල් (2) කරදිය (3) නලදමයන්ති

(4) දෙපානෝ (5) දිට්ඨමංගලිකා (........)

(35) ''ඔපෙරා ''නාටකයකි.

(1) සත්‍යාග්‍රහ (2) කරදිය (3) නලදමයන්ති

(4) දෙපානෝ (5) කැලෑමල් (........)

(36) ප්‍රේමසිරි කේමදාසයන්ගේ නාට්‍ය නිර්මාණයකි.

(1) සැළලිහිණි සන්දේශය (2) කරදිය (3) වලහැඩියා

(4) රෝමියෝ ජූලියට් (5) මානසවිල (........)

(37) ලෝක ප්‍රසිද්ධ බැලේ නාටකයක් වන ' හංසවිල' නාට්‍යයේ සංගීත අධ්‍යක්ෂවරයා වන්නේ,

(1) චෛකොව්ස්කි (2) ලේඩි ඉවනොදව් (3) අලඩයිස් නිකො

(4) ඇරිස්ටෝටල් (5) බර්නාඩ් ෂෝ (........)

නොගැලපෙන පිළිතුර තෝරන්න.

(38) නාට්‍ය කලාවේ මූලික ලක්ෂණයක් වන්නේ,

(1) සජීවී බව (2) සාමූහික ක්‍රියාකාරීත්වය

(3) නාට්‍යට පෙළක් තිබීම (4) අනුශාංගික කලා භාවිතය

(5) කිසියම් පනිවුඩයක් තිබීම. (........)

(39) හොඳ නළුවෙක් සතු ගුණාංගයන් අතරට,

(1) සබකෝලයෙන් යුක්ත විය යුතුයි (2) මනා ධාරණ ශක්තියක් තිබීම

(3) සහයෝගයෙන් කටයුතු කිරීම (4) ක්‍රියාශීලීවීම

(5) කටහඬ මිහිරි වීම

(40) හොඳ නාට්‍ය විචාරකයෙකු,

(1) අපක්ෂපාතී විය යුතුයි.

(2) නාට්‍ය කණ්ඩායම තෘප්තිමත් කළ යුතුයි.

(3) කාලීන තොරතුරු අධ්‍යයනය කළ යුතුයි.

(4) අඩුපාඩු පෙන්වා දීමට පසුබට නොවිය යුතුය.

(5) මනා අවබෝධයකින් යුක්තව සිටිය යුතුයි. ( ලකුණු 1x 40 = 40 යි )

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# නාට්‍ය හා රංගකලාව - II

**12 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි.**

- **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න 02 බැගින් තෝරාගෙන ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

## A කොටස

01 (1) ප්‍රාසාංගික කලාව යන්න හඳුන්වන්න. (ල. 04)

(2) ප්‍රාසාංගික කලාවේ සුවිශේෂී ලක්‍ෂණ පහදන්න. (ල. 05)

(3) ප්‍රාසංගික කලා දෙකක් වන නාට්‍ය හා සංගීතය අතර වෙනස පහදන්න. (ල. 06)

02 (01) 'අභිනය ' යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න. (ල.04)

(02) සංස්කෘත නාට්‍ය කලාවෙහි සාත්වික හා ආංගික අභිනයෙන් දක්වා ඇති අයුරු පහදන්න.(ල. 05)

(03) ඔබ උගත් නාට්‍යයක් ඇසුරෙන් එහි සතර අභිනය භාවිතා කර ඇති අන්දම පහදන්න. (ල. 06)

03 (1) නාට්‍යයක වස්තුව යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල. 04)

(2) ඇරිස්ටෝටල්ට අනුව ට්‍රැජඩියක මූලිකාංග පහදන්න. (ල. 05)

(3) සංස්කෘත නාට්‍යයෙහි දක්වා ඇති අවස්ථා පංචකය හඳුන්වා පහදන්න. (ල. 06)

## B කොටස

04 (1) උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායන්ට අයත් ශාන්ති කර්ම දෙක බැගින් නම් කරන්න. (ල. 04)

(2) ඉහත නම් කරන ලද ශාන්ති කර්මයන්හි ඇති නාට්‍යමය අවස්ථා නම් කරන්න. (ල. 05)

(3) ඉහත ලක්‍ෂණ දේශීය නාට්‍ය කලාව විකාශනයෙහි බලපෑ ආකාරය පහදන්න. (ල. 06)

05 (1) රංග අභ්‍යාසය යනු කවරේද? (ල. 04)

(2) ඔබ දන්නා රංග අභ්‍යාස වර්ග 02 ක් නම් කොට විස්තර කරන්න. (ල. 05)

(3) රංග අභ්‍යාසය මගින් නළුවාට අත්වන ප්‍රයෝජන කවරේදැයි පහදන්න. (ල. 06)

06 (1) නාට්‍යයක සෞන්දර්ය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

(2) හොඳ ප්‍රේක්ෂක ප්‍රතිචාර මත නාට්‍යයේ සාර්ථකත්වය රඳා පවතියි. ඔබේ අදහස් දක්වන්න.

(3) හොඳ කලා නිර්මාණ බිහිවීමෙහිලා විචාරකයින්ගේ අදහස් අත්‍යවශ්‍යයි. විමසන්න.

(ල. 15)

(ලකුණු 4 x 15 60 යි.)